**ශීර්ෂය - 166 -ජල සම්පාදන අමාත්‍යාංශය**
**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

ජල සම්පාදන අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 24 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක එස්ජ්/එම්ජ්ජ්/02/01/01 දරන හා 2022 ජනවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල "වාර්තා කිරීමේ පදනම" සංශෝධනය කර තිබුණ ද, අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් එය හෙළිදරව් නොකර ඉකුත් වර්ෂයේ සංඛ්‍යා සංශෝධනය පමණක් සිදුකර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළබඳව මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව වැටුප් වේතන හා අනිකුත් සේවක ප්‍රතිලාභ වෙනුවෙන් වූ පුනරාවර්තන වියදම රු. 93,158,336 ක් වුව ද, අමාත්‍යාංශ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු. 3,015,900 ක් වැඩියෙන් රු. 96,174,236 ක් ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. වෙනත් අදහස් දැක්වීමත් නොමැත. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව අනෙකුත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් වූ පුනරාවර්තන වියදම රු. 83,105,722 ක් වුව ද අමාත්‍යාංශ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු. 3,015,900 ක් අඩුවෙන් රු. 80,089,822 ක් ලෙස දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | - එම - |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වූ රු. 388,116,972 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ තුළ රු. 350,294,498 ක් වටිනා ප්‍රවාහන උපකරණ අමාත්‍යාංශය සතුව පවතින බව ඊට අදාල ඒසීඒ6 ආකෘති පත්‍රය අනුව දක්වා තිබුණ ද, එම ප්‍රවාහන උපකරණ තුළ රු. 94,830,000 ක් වටිනා වෙනත් ආයතන වලට අයත් මෝටර් වාහන 14 ක් ඇතුළත් බවත් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කොට තිබූ රු. 4,500,000 ක් වටිනා ඩබල් කැබ් රථයක් ඇතුළත් නොවන බවත් පසුගිය වර්ෂ වල දී අපහරණය කර තිබූ රු. 8,100,000 ක් වටිනා මෝටර් වාහන 03 ක් පොත් වලින් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ගිණුම් පොත් වලට ඇතුළත් කොට තිබූ බවත් | පිළිතුරු ලබා දී නැත. | අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු වීම. |

අමාත්‍යාංශ පොත් හා ස්ථාවර වත්කම් ලේඛනය සම්බන්ධයෙන් කළ විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඉහත ඌනතා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් ස්ථාවර වත්කම් වටිනාකමේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහ යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් රු. 176,251,618 ක් වැයකොට ඇති බව දක්වා තිබුණ ද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු. 9,858,703,850 ක් වූයෙන් එම වටිනාකම් අතර එකතු වටිනාකම රු. 9,682,452,232 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වීම. |
| (ආ) ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැයකරන මුදල් ප්‍රවාහ යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිල දී ගැනීම් සඳහා රු. 9,686,978,781 ක් දරා තිබූ බව දක්වා තිබුණ ද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒ වෙනුවෙන් දරා ඇති වියදම රු. 4,526,549 ක් පමණක් වූයෙන් රු.9,682,452,232 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති 32 ක ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 78,320 ක් විය. එසේ වුව ද, එම ව්‍යාපෘති වල වියදම | රටේ පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් හා අයහපත් ආර්ථික තත්ත්වය | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 51,823.5 ක් පමණක් වූයෙන් රු. මිලියන 26,496.5 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයට ඉතිරිය සියයට 34 ක් වී තිබුණි. | හේතුවෙන් නිසි පරිදි අක්මුදල් නොලැබීම මීට හේතු විය. | කළ යුතු වීම. |
| (ආ) | වැය විෂයය සංකේත අංක 166-1-2-1703 යටතේ රු. 100,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | රටේ පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් අපේක්ෂා කළ පරිදි අමාත්‍යාංශ කාර්යයන් ඉටුකර ගත නොහැකි වීම මීට හේතු විය. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයය තුනක් සඳහා වූ රු. 1,800,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ සම්පූර්ණයෙන් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | විදේශ ගමන් තාවකාලිකව අත්හිටුවීමත් නිල ඇඳුම් සඳහා ඉල්ලීම් අපේක්ෂිත පරිදි ඉදිරිපත් නොවීමත් නිසා ප්‍රතිපාදන ඉතිරිවිය. | - එම - |
| (ඈ) | පුනරාවර්තන වැය විෂයය 05 ක රු. 1,970,500 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 53 දක්වා වූ ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි. | කොරෝනා තත්ත්වය තුළ රට වසා තැබීම හේතුවෙන් අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම මීට හේතු විය. | - එම - |
| (ඉ) | ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා හේතුවෙන් පුනරාවර්තන වැය විෂය 05 ක රු. 8,350,000 ක් වූ වාර්ෂික අය වැය ප්‍රතිපාදනයෙන් සියයට 31 සිට සියයට 98 දක්වා ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි. | රටේ පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගත නොහැකි වීම මීට හේතු විය. | - එම - |
| (ඊ) | පුනරාවර්ථන වැය විෂය 03 ක රු. 4,100,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 36 සිට සියයට 98 ක අතර ප්‍රමාණයක් මු.රෙ. 66 මගින් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි. | අපේක්ෂිත වියදම් ඒ ආකාරයෙන් පැන නොනැඟි අතර වැය විෂයන්වල අවශ්‍යතා මත ප්‍රතිපාදන, පවතින නීති රෙගුලාසි තුළ මාරු කරන ලදී. | - එම - |
| (උ) | මූලධන වැය විෂය 10 ක් සඳහා වූ රු.මිලියන 1,442.7 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | මහා භාණ්ඩාගාර අධාර නොලැබීම, තාවකාලික ගෙවීම් කටයුතු සඳහා ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් නොවීම, වෙන්කරගත් ඇතැම් ප්‍රතිපාදන වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් නොවීම, ආනයනය කරන ලද උපකරණ සඳහා නොගෙවීම, වර්ෂය තුළ ආනයන නොකිරීම, මාර්ග හානි ගෙවීම් හා ඉඩම් අත්පත් කර ගැනීම් සිදු නොවීම, රේගු බදු/ වැට් බදු සඳහා ගෙවීම් සිදු නොවීම ආදී කරුණු මත ප්‍රතිපාදන ඉතිරි විය. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඍ) | මූලධන වැය විෂයය 21 ක් සඳහා වූ රු. මිලියන 67,771 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2 සිට සියයට 94 දක්වා වූ ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂා කළ වියදම් ඇති නොවීම මීට හේතු විය. | - එම - |
| (එ) | මු.රෙ. 66 මගින් වෙනත් වැය විෂයයන්ගෙන් මූලධන වැය විෂයය 02 ක් සඳහා රු.මිලියන 1,327.05 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබූ නමුත් එසේ මාරුකරගත් ප්‍රතිපාදන ද ඉක්මවා අදාල වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට බිල්පත් නිර්දේශ කරන විට ප්‍රතිපාදන පැවතිය යුතු බැවින් මෙලෙස මාරු කරන ලදී. | - එම - |
| (ඒ) | ඇස්තමේන්තු සකස්කිරීමේ දුර්වලතා හේතුවෙන් මූලධන වැය විෂයය 03 ක් සඳහා වූ රු.මිලියන 14,194.67 ක වාර්ෂික අය වැය ප්‍රතිපාදනයෙන් සියයට 61 සිට සියයට 81 දක්වා ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි. | කොරෝනා තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත කාර්යයන් ඒ අයුරින් ඉටුකිරීමට නොහැකි වීම මීට හේතු විය. | - එම - |
| (ඔ) | මූලධන වැය විෂය 06 ක රු. මිලියන 25,134.16 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 04 සිට සියයට 34 දක්වා ප්‍රමාණයක් මු.රෙ. 66 මගින් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. | රටේ පැවති අයහපත් තත්ත්වය මත අපේක්ෂිත වියදම් ඒ ආකාරයෙන් පැන නොනැඟීම මෙයට හේතු වේ. | - එම - |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 උපවගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (ඇ) | අවස්ථා 33 ක දී විවිධ කාර්යයන් සඳහා නිකුත් කළ රු. 251,979 ක තත් කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වූ වහාම නිරවුල් කර නොතිබුණි. තව ද, අවස්ථා 14 ක දී පෙර ලබාදුන් අත්තිකාරම් මුදල පියවීමට පෙර රු. 72,093 ක නැවත අත්තිකාරම් ලබා දී තිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අත්තිකාරම් පියවීම ප්‍රමාද විය. | කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අමාත්‍යාංශය සතු වාහන 20 ක් සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | ඉතිරි වාහනවල ඉන්ධන පරීක්ෂාව ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු යොදා ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදුකළ යුතු වීම. |
| (ඈ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | | |
| | (i) 3.1.4.ඡේදය | 2020 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ඌනතා, අතිරික්තතා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට වාර්තා කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) 3.1.5. ඡේදය | පොදු 47 වාර්තාවෙන් දක්වා ඇති භාණ්ඩ සම්බන්ධයෙන් සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර අවශ්‍ය කටයුතු කළ යුතු වුවත් 2020 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් වෙන්දේසි කළයුතු හා අපහරණය කළ යුතු භාණ්ඩ සඳහා එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | - එම - |
| (ඉ) | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 3.1 ඡේදය | අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ විෂය භාර අමාත්‍යවරයා වෙත වාහන 04 ක් වෙන්කර තිබුණි. | හිටපු ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි රත්නපුර දිස්ත්‍රික්කයේ ජල සම්පාදන ව්‍යාපෘති අධීක්ෂණය සඳහා මාසයක කාලයක් සඳහා ලබාදෙන ලදී. | ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද , එම චක්‍රලේඛයේ ඡේද අංක 3 ප්‍රකාරව සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. තව ද, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඇතැම් ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට අපේක්ෂිත සමස්ථ ප්‍රගතිය දක්වා නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර 2023 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කිරීම. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදනයන්ට අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වීම. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා පරිමාණ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති 09 ක් සම්බන්ධයෙන් 2021 අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත භෞතික ප්‍රගතිය ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය, අහිතකර කාලගුණ තත්ත්වය, ආනයනය කළ යුතු උපකරණ සහ අමුද්‍රව්‍ය ලැබීම ප්‍රමාද වීම, උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම හා ඔවුන්ගේ දුර්වල කාර්යක්ෂමතාවය, ව්‍යාපෘති විෂයපථයන්ගේ වෙනස්වීම්, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාදවීම්, ගොවි විරෝධතා යනාදිය මීට හේතු විය. | වර්ෂය ආරම්භයේ දී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. |

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| චීන රජයේ ප්‍රදානයක් ලෙස රු. මිලියන 1,950 ක පිරිවැයක් දරා ඉදිකළ ජල තාක්ෂණය සඳහා වන චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්ෂයේණ හා ආදර්ශන මධ්‍යස්ථානය 2021 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා රජය වෙත භාර දී තිබුණ ද, විගණිත දින වූ 2022 ජනවාරි 10 දින වන විටත් මෙමගින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුහුණු මධ්‍යස්ථානය ඉදිකළ පසු එහි අවශ්‍ය කටයුතු නිසිලෙස සිදුකිරීමට අවශ්‍ය සියළුම කටයුතු ව්‍යාපෘතිය මගින් සිදු කරන ලදී. | ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ප්‍රමාදයන්, කොවිඩ් 19 බලපෑම හා රාජ්‍ය වියදම් සමාලෝචනයට අනුව ප්‍රතිපාදන කපාහැරීම යනාදිය හේතුවෙන් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට යටත් වන විදේශ මූල්‍යාන ව්‍යාපෘති 16 ක් සඳහා නිම කිරීම් කාලය ඉක්මවා කොන්ත්‍රාත් දිගුවන් ලබා දී ඇති බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් එම ව්‍යාපෘති නිම කිරීමේ කාලය දින 184 සිට දින 1,779 කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් කාලය තුළ අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතියි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.5 ප්‍රසම්පාදනයන්

---

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක් ආවරණය වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හෝ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකසා අනුමත කර ඒ අනුව කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) | චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වෑන් රථයක් කුලී පදනම මත ලබා ගැනීමේ දී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙනුවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය මගින් ප්‍රසම්පාදන කටයුතු සිදුකරවාගෙන තිබූ අතර එම වෑන් රථය සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 1,871,080 ක් කුලිය වශයෙන් ගෙවා තිබුණි. | සියළු කටයුතු නිසි ක්‍රමවේදයකට අනුව සිදුකර ඇති අතර ඒ සඳහා සියළු අනුමැතීන් ලබාගෙන ඇත. | ප්‍රසම්පාදන කටයුතු අදාල ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සිදු කළයුතු වීම. |

**3.6 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) <u>අනුමැතියකින් තොරව වාහන භාවිතා කිරීම</u>**<br>රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාල 2010 මැයි 14 දිනැති සීඒ /1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 3.3 ඡේදය ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍යවරයා විසින් පරිහරණය කරනු ලබන ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් CBG-7386 දරන වාහනය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මේවන විට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. | ලබා දී ඇති ජනාධිපති කාර්යාල උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ආ) <u>වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීම</u>**<br>වෙනත් රාජ්‍ය ආයතන 04 ක් සතු වාහන 09 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුල පරිහරණය කර තිබුණි. | මෙම අමාත්‍යාංශයේ විටින් විට අමාත්‍යවරු මාරු වීම සහ ලේකම්වරු මාරුවීම හේතුවෙන් ඔවුන් ගෙනෙන ලද වාහන මෙම අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා සහ කාර්ය මණ්ඩලය වෙත ද අමාත්‍යාංශ නිලධාරීන්ගේ භාවිතය සඳහා යොදාගෙන ඇත. | වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීමේදී ඒවා විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ) <u>ධාවනයට යොදා නොගන්නා වාහන</u>**<br>ධාවනයට යොදා නොගෙන වාහන 03 ක් අමාත්‍යාංශය භූමියේ ආවරණයක් රහිතව ගාල්කර තිබූ අතර එකී වාහන අලුත් වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | මෙම වාහන අපහරණය කිරීමට තීරණය කර තිබුණ ද, අමාත්‍යාංශයේ ප්‍රමාණවත් වාහන නොමැති වූ හෙයින් ඒවා අලුත්වැඩියා කිරීම සඳහා ලේකම් තුමා විසින් අනුමැතිය දී ඒ අනුව කටයුතු කරනු ලබයි. | ධාවනයට යොදා නොගන්නා වාහන අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඈ) <u>වෙනත් ආයතන වලට මුදාහල වාහන</u>**<br>අමාත්‍යාංශය විසින් 2019 මැයි 08 දින සිට එක් වාහනයක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට ද, වාහන 02 ක් 2020 අගෝස්තු 25 දින සිට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ද මුදාහැර තිබුණි. | වාහන අවශ්‍යතාවය මත එම ආයතන දෙක සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ඇතිව එම රථ ලබාදී ඇත. | වෙනත් ආයතන වලට මුදාහල වාහන නැවත ලබා ගැනීමට හෝ ඒවා විධිමත් පරිදි මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. |

**(ඉ) නිෂ්කාර්යය වත්කම්**

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ ඇති වීන ශ්‍රී ලංකා පර්යේෂණ මධ්‍යස්ථානයේ ගාල් කර තිබූ රු. 39,183,806 ක් වටිනා ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය 2020 සැප්තැම්බර් 15 සිට 2022 මාර්තු 31 දින දක්වා කිසිදු පර්යේෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන ආවරණයක් රහිත එළිමහන් භූමියේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි. | ඉතා ඉක්මණින් එහි සේවා සැපයීම සඳහා අවශ්‍ය සියළුම කටයුතු සිදුකිරීමට හැකි වනු ඇත. | නිශ්කාර්යය වත්කම් අපේක්ෂිත කාර්යයන් සඳහා කඩිනමින් යොදාගත යුතු වීම. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128(1) හා 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 හා 06 ජේද ප්‍රකාරව ඇප තැබීමට බැඳී සිටින නිලධාරින් මාස 03 ක් ඇතුළත ඇප තැබිය යුතු අතර චක්‍රලේඛයේ සඳහන් නොවන නමුත් ඇප තැබිය යුතු තනතුරු දරන වෙනත් නිලධාරීන් වෙතොත් එම නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීම ආයතන ප්‍රධානියාගේ වගකීමක් වුවත් අමාත්‍යාංශයේ සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු දරන නිලධාරීන් 05 දෙනෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා 2022 මාර්තු 01 දින විශ්‍රාම ගොස් ඇති අතර සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු තිදෙනෙක් ඇප තැන්පත් කර ඇත. | ඇප අය කර ගත යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.8 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදී.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදය මත ව්‍යාපෘති 23 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 33,373,453 ක මුදලක් පොලී වශයෙන් ගෙවා තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගත වේ. | ව්‍යාපෘති ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළයුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව සේවයේ යෙදවිය යුතු ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණය සේවයේ යොදවා නොතිබුණ ද, අමාත්‍යාංශය විසින් අදාල සේවාවන් සැපයූ ආයතනය වෙත රු. 129,578 ක් ද, කාර්යාලය පිරිසිදු කිරීම හා සනීපාරක්ෂක සේවා සැපයූ ආයතනය වෙත රු. 432,499 ක් ද වශයෙන් රු. 562,077 ක් වැඩිපුර ගෙවා තිබුණි. මීට අමතරව 2021 පෙබරවාරි 15 සිට 2021 පෙබරවාරි 28 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සේවකයින්ගේ පැමිණීම සනාථ කරගැනීමෙන් තොරව කාර්යාල පිරිසිදු කිරීම හා සනීපාරක්ෂක සේවා සැපයූ ආයතනය වෙත රු. 147,500 ක් ගෙවා තිබුණි. | ඉදිරියේ දී සේවා මුර සඳහා නියමිත පරිදි අත්සන් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.9 කළමනාකරණ දුර්වලතා**

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍ය කාර්යය මණ්ඩලයේ, රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල වෙනුවෙන් සේවකයින්ගෙන් හා ආයතනයෙන් අයකර ගන්නා මුදල් නොපමාව අදාල ආයතනය වෙත යැවිය යුතු වුවත් 2020 දෙසැම්බර් සිට 2021 සැප්තැම්බර් දක්වා අවස්ථා 07 ක දී සේවක අර්ථසාධක දායකය වෙනුවෙන් ගෙවිය යුතු රු. 1,071,320 ක් ප්‍රමාද වී ප්‍රේෂණය කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා කාර්යාලය වසා තැබීම හේතුවෙන් තැපැල් කිරීම් ප්‍රමාද විය. | ව්‍යවස්ථාපිත ගෙවීම් නොපමාව අදාල ආයතන වෙත ප්‍රේෂණය කළ යුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජල සම්පාදන අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අරමුණු ලෙස 2030 වන විට සැමට අපේක්ෂිත පානීය ජලය ලබාදීම හා සනීපාරක්ෂක පහසුකම් තහවුරු කිරීම හඳුනාගෙන තිබුණි. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලෙස නල ජල ආවරණ ඉලක්කය සියයට 60.38 ක් කරා ළඟාවීම | කාර්යසාධක දර්ශක සංශෝධනයෙන් පසුව ඉලක්කගත ජල සම්බන්ධතා සංඛ්‍යාවෙන් 89.3 % ක් සපුරා ඇත. | කාර්යසාධන දර්ශක ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලෙස දක්වා තිබූ අතර ඒ සඳහා ලබා දිය යුතු අවම නල ජල සම්බන්ධතා සංඛ්‍යාව 435,851 ක් විය. ඉහත ඉලක්ක ගත ජල සම්බන්ධතා ප්‍රමාණයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සම්බන්ධතා 313,504 ක ඉලක්කයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, එම ඉලක්කය 2022 ඔක්තෝබර් මාසයේ දී 215,000 ක් ලෙස සංශෝධනය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානයට ලබා දී තිබූ නව ජල සම්බන්ධතා ප්‍රමාණය 192,087 ක් පමණක් හෙවත් ඉලක්ක ගත ජල සම්බන්ධතා සංඛ්‍යාවෙන් සියයට 89.3 ක් විය. | | |
| (ආ) | 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/8/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නම් කර නොතිබුණි. | පිළිගනිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**5. යහපාලනය**

**5.1 විගණන හා කළමනාකරණ කමිටුව**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව අස්ථිතායෙහි ක්‍රියාකාරීත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීමේ කාර්ය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු අතර 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව එකී කමිටුව කාර්තුවකට අවම වශයෙන් එක් රැස්වීම බැගින් වාර්ෂිකව රැස්වීම් 04 ක් පැවැත්විය යුතු විය. කෙසේ වෙතත්, ඩීඑම්ජ්/ඒඑම්සී/එම්/2021/02 අංක දරන හා 2021 අගෝස්තු 06 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව වර්ෂයකට කමිටු රැස්වීම් 02 ක් පැවැත්වීම ප්‍රමාණවත් ලෙස දක්වා තිබුණ ද අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ එක් රැස්වීමක් පමණි. | 2021 මැයි 11 දින එක් රැස්වීමක් පවත්වන ලදී. | ජාතික විගණන පනතේ හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛවල නිර්දේශ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

**6. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම** | | |
| (i) අමාත්‍යාංශයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 35 ක් වූ අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 24 ක් පමණ විය. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 14 ක්, තෘතියික මට්ටමේ තනතුරු 04 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 10 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක පුරප්පාඩු පවතුණි. | අදාල පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර එවන ලෙස රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා තිබුණ ද මේවන තෙක් නිලධාරීන් පත්කර නොමැත. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ දී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 කින් අනුමත කාර්ය මණ්ඩලය වැඩිකරවාගෙන තිබූ නමුත් 2020 වර්ෂයේ දී එකී තනතුරු වල නිලධාරීන් 03 ක ඌනතාවයක් ද, 2021 වර්ෂයේ දී නිලධාරීන් 06 ක ඌනතාවයක් ද නිරීක්ෂණය විය. | - එම - | අවශ්‍යතාවය අනුව තනතුරු අනුමත කරවා ගත යුතු වීම. |
| (iii) අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ව්‍යාපෘති අධීක්ෂණ) තාවකාලික තනතුරක් අනුමත කරවාගෙන ඒ සඳහා 2021 ජුනි 14 දින සිට කොන්ත්‍රාත් පදනමින් නිලධාරියෙකු බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ වැටුප් ලෙස රු. 574,800 ක් ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් මෙම නිලධාරියා පත්කර ඇත. | - එම - |
| (iv) අමාත්‍යාංශය සඳහා වරින් වර තනතුරු අනුමත කරවාගෙන තිබුණ ද ඒ සඳහා ස්ථිර බඳවාගැනීම් සිදු නොකර වැඩ බැලීමේ පදනමින් හා රාජකාරී ඉටුකිරීමේ පදනමින් නිලධාරීන් බඳවා ගැනීම නිසා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකු සඳහා රාජකාරී ඉටුකිරීමේ දීමනා හා අනෙකුත් දීමනා ලෙස රු. 2,183,752 ක මුදලක් ගෙවා තිබුණි. | අදාල තනතුරු සඳහා නිලධාරීන් පත්කරන ලෙස දන්වා තිබුණ ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් නොමැති වීම නිසා රාජකාරී ඉටුකිරීමේ පදනමින් නිලධාරීන් පත්කරන ලදී. | අනුමත තනතුරු සඳහා ස්ථිර බඳවාගැනීම් සිදුකළ යුතු වීම. |
| (v) රාජ්‍ය වියදම් කළමනාකරණය යන හිසින් යුත් 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.2 ඡේදයේ දක්වා ඇති තනතුරු සඳහා සේවකයින් අනියම් හෝ | අමාත්‍ය මණ්ඩලය වෙනුවෙන් කරන සියළු බඳවා ගැනීම් ගරු අමාත්‍යතුමාගේ අභිමතය | සේවකයින් අනියම් හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලබන්නේ නම්, ඔවුන් |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලබන්නේ නම්, ඔවුහු රජයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් සපුරා තිබිය යුතු වුවත්, අමාත්‍ය කාර්යය මණ්ඩලය වෙනුවෙන් බඳවාගෙන තිබූ තනතුරු 03 කට අදාල සේවකයින් 06 ක් නියමිත සුදුසුකම් සපුරා ඇති බවට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | පරිදි සිදුකරන හෙයින් අදාල සුදුසුකම් පරීක්ෂා කිරීම බොහෝවිට ප්‍රායෝගික නොවේ. | රජයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කර ගතයුතු වීම. |

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත්**

| | | |
|---|---|---|
| (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලද තොරතුරු අනුව තනතුරු 06 කට අයත් මණ්ඩලයේ සේවකයින් 21 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ දී අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදවා තිබූ අතර එකී නිලධාරීන් හා සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 28.73 ක් වැටුප් හා දීමනා වශයෙන් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | මෙම සේවකයින් අමාත්‍යාංශය වෙත නිදහස් කරගෙන ඇත්තේ 2018 වර්ෂයේ දී ය. | වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් අදාල ආයතන වෙත නැවත නිදහස් කළයුතු වීම. |
| (ii) කෙසේ වෙතත්, අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් තනතුරු 08 කට අදාල නිලධාරීන් හා සේවකයින් 15 ක් පමණක් අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවාගෙන තිබූයෙන් අනෙක් නිලධාරීන් හය දෙනා කවර ස්ථානයකට අනුයුක්තව සේවය කරන්නේදැයි විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය. | සේවකයින්ගෙන් 07 දෙනෙකු මේ වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නැවත නිදහස් කර ඇත. | - එම - |